# ශ්‍රී ලංකාවේ පුද්ගලයින් සියදිවි හානි කර ගැනීමේ ප්‍රවණතාවය

**යූ .පී. පී. එස්. සමරනායක**[1]

## සංක්ෂේපය

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ විවිධාකාර වූ මිනිසුන් ජීවත් වේ. මොවුන් කුමන හෝ හේතුවකින් මරණයට පත් වෙයි. පුද්ගලයන්ගේ මරණයන් සිදුවීම උදෙසා විවිධ කරුණු බලපානු ලබයි. එනම්, මෙම විවිධ වූ කාරණා තුළට බෝවන රෝග, බෝනොවන රෝග මෙන්ම ස්වාභාවික විපත්, හදිසි අනතුරු යනාදිය දක්වාලිය හැකිය. මීට අමතරව පුද්ගලයින් සියදිවි නසා ගැනීම් තුළින් ද මරණයට පත්වේ. විශේෂයෙන්ම අද වන විට, ශ්‍රී ලංකාව තුළ සියදිවි නසා ගැනීම් බහුලව දක්නට ලැබේ. 2014 වර්ෂයේ දී, ලෝක සෞඛ්‍යය සංවිධාන වාර්තාව මඟින් දක්වන පරිදි සියදිවි නසා ගැනීම් සිදුවන රටවල් 172 ක් අතුරින් 04 වන ස්ථානය ශ්‍රී ලංකාවට හිමි වී ඇත. වර්තමානයේ ද සියදිවි නසා ගැනීම් පිළිබඳ වාර්තා දක්නට ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පුද්ගලයින් සියදිවි හානි කර ගැනීමේ ප්‍රවණතාවය අධ්‍යයනය කිරීම මෙහි අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත භාවිත කරන ලද අතර ඒ සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ජීව සංඛ්‍යා ලේඛන අංශය මඟින් නිකුත් කරන ජීව සංඛ්‍යාන වාර්තා මඟින් දත්ත ලබා ගන්නා ලදී. සියදිවි හානි කර ගැනීමේ ප්‍රවණතාවය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රම මෙන්ම පරාමිතික මෙන්ම අපරාමිතික පරීක්ෂාවන් භාවිත කර ඇත. මෙම අධ්‍යයනය හරහා සියදිවි හානි කර ගැනීම්වලට බහුලව යොමුවී ඇත්තේ, පුරුෂ පක්ෂය බව අනාවරණය විය. සියදිවි නසා ගන්නා පුරුෂ පක්ෂය අවුරුදු 45-60 වයස් පරතරය තුළ බව ද, ස්ත්‍රී පක්ෂය අවුරුදු 15-30 වයස් පරතරය තුළ බවත් මෙමඟින් අනාවරණය කර ගත හැකි විය. වැඩි වශයෙන් සියදිවි හානි කර ගන්නා දිස්ත්‍රික්කය කුරුණෑගල දිස්ත්‍රික්කය බව හඳුනා ගත හැකි විය. එමෙන්ම සියදිවි නසා ගැනීමේ හේතු ලෙස සමාජ සාධකයන්, අධ්‍යාපනය හා විරැකියාව ආදිය බව සොයා ගත හැකි විය. දිනෙන් දින ඉහළ යන සියදිවි නසා ගැනීම් අඩු කිරීමට නම් සියලු දෙනා ඒකාබද්ධව ගැටලු හඳුනාගෙන අවබෝධයෙන් යුතු ව ජීවත් විය යුතු ය.

**මුඛ්‍ය පද :** සියදිවි හානි කර ගැනීම, සංඛ්‍යාන වාර්තා, ප්‍රවණතාවය, විරැකියාව, අධ්‍යාපනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, prabodhasubha@gmail.com